**ජාතික මූලික අධ්‍යයන ආයතනය - 2019**
**-------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික මූලික අධ්‍යයන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.132,990,941 ක් වූ ජංගම නොවන වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ජංගම නොවන වත්කම්වලට අදාළ ප්‍රත්‍යාගණන වාර්තා ලැබුණු පසු තවදුරටත් භාවිතයට ගනු ලබන වත්කම් අගයන් ප්‍රතිශෝධනය වනු ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.118,388,385 ක් වූ ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 90 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන සංචිතය සම්බන්ධයෙන් අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලික අධ්‍යයන ආයතනය විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදු කිරීම ප්‍රමුඛතම කාර්යභාරය වුවත්, ඊට අදාළ වියදම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි. | පර්යේෂණ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම සඳහා කටයුතු කරමි. | නියමිත ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශනවලට හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් රු.29,853,300 ක් වටිනා භාවිතයට ගත නොහැකි වත්කම් හා රු.5,693,070 ක් වටිනා අස්ථානගත වූ වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | සඳහන් කර ඇති අගයන් නැවත සමීක්ෂණය කර අදාළ වත්කම් අපහරණය කිරීම සඳහා සටහන් තබා ගන්නා ලදි. | ස්ථාවර වත්කම් පාලනය හා ගිණුම් තැබීමට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමය වැඩි දියුණු කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ඉඩම් | 28,622,151 | අයිතිය තහවුරු කිරීමට අදාළ තොරතුරු | ආයතනයේ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතින අතර එම වාර්තා ලද විගස ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වත්කම්වලට අදාළ සක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාර්යාල උපකරණ, පුස්තකාල පොත් හා වාහන | 728,547,724 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා | කොවිඩ් වසංගතය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර එම වාර්තා හැකි ඉක්මණින් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 101 හා මුදල් රෙගුලාසි 104 | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් අස්ථානගතවී ඇති ලෙසට හඳුනාගෙන ඇති රු.5,693,070 ක් වටිනා ඉන්වෙන්ට්‍රි අයිතම 332 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර ඉන් රු.344,915 ක් වටිනා භාණ්ඩ පාලක මණ්ඩලයේ නිර්දේශ මත පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර තිබුණි. | වටිනාකම රු.344,915 ක් වූ අස්ථානගත වූ භාණ්ඩ පොත්වලින් ඉවත් කරන ලද අතර ඉතිරි භාණ්ඩ සොයා ගැනීම පිණිස භාණ්ඩ අනු ලැයිස්තු නඩත්තුව ආරම්භ කර ඇත. | අස්ථානගත වූ භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 770 | 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාවිතයට ගත නොහැකි භාණ්ඩ ලෙස නිර්දේශිත රු.29,853,300 ක් වටිනා ඉන්වෙන්ට්‍රි අයිතම් 397 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එම භාණ්ඩ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරවා ගෙන ඉදිරියේදී වෙන්දේසි කිරීමට පියවර ගනු ලැබේ. | භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය | 2018 වර්ෂයට අදාළව අවසන් වාර්ෂික වාර්තාව හා සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණන දිනය වූ 2020 මැයි 15 වන විටත් පිළියෙල කර නොතිබුණි. | 2018 වර්ෂයේ වාර්තාව සකස් කිරීම කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ප්‍රමාද වූ අතර මේ වන විට සකස් කරමින් පවතී. | අදාළ පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) 1978 දෙසම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.1,028,564,797 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට අවශ්‍ය මූලික පියවර මේ වන විට සිදු කරමින් පවතී. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.79,107,598 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.99,558,195 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.20,450,597 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. මෙම වැඩිවීමට පුනරාවර්තන ප්‍රදාන ලැබීම වැඩි වීම හා සැපයුම් හා පරිභෝජන වියදම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වාම ඌනතාවයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් ගැලපීමේදී 2015 වර්ෂයේ රු.104,397,176 ක් වූ ආයතනයේ දායකය 2019 වර්ෂයේදී රු.170,341,905 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සඳහා Intergraded Software පද්ධතියක් ස්ථාපිත කිරීමට පුද්ගලික ආයතනයක් සමග 2016 මාර්තු 28 දින රු.2,200,000 ක මුදලකට ගිවිසුම්ගතවී රු.660,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ඒ සඳහා පරිගණක හා පරිගණක උපාංග මිලදී ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 27 දින සිට 2019 පෙබරවාරි 02 දක්වා කාලපරිච්ඡේදය තුල ආයතනය රු.6,864,960 ක් වැය කර ඇතත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | රු.6,864,960 ක පරිගණක උපාංග මිලදී ගෙන ඇත්තේ මෘදුකාංග පද්ධතිය සඳහාම පමණක් නොවන අතර අදාළ ආයතනය සමග එළඹී ගිවිසුම් ප්‍රකාරව රු.660,000 ක අත්තිකාරම් මුදල් ගෙවීමට සිදුවන ලදි. 2020 මාර්තු 03 දින සිට මෙම පද්ධතිය සජීවී ධාවනය ආරම්භ කර ඇති අතර මේ වන විට පරීක්ෂණ මට්ටමේ පවතී. | අදාළ ගිවිසුම් ප්‍රකාරව මෙම පද්ධතියේ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 1990 ජූනි 08 දින ආයතනය වෙත පවරන ලද අක්කර 14, රූඩ් 02, පර්චස් 17.5 ක වපසරියකින් යුතු හන්තාන වතු යායට අයත් ඉඩමෙහි නීත්‍යානුකූල බුක්තිය ලබා ගැනීමට විගණිත දිනය වූ 2020 ජූනි 30 දක්වාම කටයුතු කර නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පවරාගෙන ඇති මෙම ඉඩම සම්බන්ධයෙන් මේ වන විට මහාධිකරණයේ නඩු කටයුත්තක් පවතින බැවින් අප ආයතනයට ඒ සඳහා මැදිහත් වීමට නොහැකි වී ඇත. | පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වන පරිච්ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 19 සිට 2020 මාර්තු 18 දක්වා කාලපරිච්ඡේදය සඳහා කොළඹ විශ්වවිද්‍යායේ කොන්ත්‍රාත් පදනම මත ජොෂ්ඨ මහාචාර්ය තනතුරක කටයුතු කිරීම සඳහා මහාචාර්යවරයකුට නිවාඩු අනුමත කර නිදහස් කර තිබුණි. ඒ සඳහා ආයතනයේ පාලක මණ්ඩලය විසින් 2017 ඔක්තෝබර් 07 දින සිට ආයතන සංග්‍රහයේ නිවාඩු සඳහා වූ පරිච්ඡේදය අභිබවා නිවාඩු ක්‍රමයක් හඳුන්වාදී තිබුණි. | ජාතික මූලික අධ්‍යයන ආයතනයේ ආචාර්ය, මහාචාර්යවරු විශ්වවිද්‍යාල පද්ධතියට සමාන වැටුප් ලබන බැවින් විශ්වවිද්‍යාල පද්ධතියේ නිවාඩු අනුමත කරන ක්‍රමයට නිවාඩු අනුමත කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව කටයුතු කළ යුතුවේ. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයන්වල ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදිත රු.63,862,681 ක මුදලක් අදාළ කාර්ය වෙනුවෙන් උපයෝජනය නොකර ඉන් රු.51,287,288 ක් 2018 දෙසැම්බර් 27 දින රජයේ බැංකුවක ආයෝජනය කර තිබුණි. | මේ වන විට මෙම මුදල් අදාළ කටයුතු සඳහා උපයෝජනය වෙමින් පවතී. | අරමුදල් කඩිනමින් උපයෝජනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමස්ථ ප්‍රගතිය සියයට 46 ක් පමණක් විය. | මහා භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදනයන් මුදා හැරීම වර්ෂයේ අග භාගයේ සිදු වූ බැවින් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. | ප්‍රසම්පාදන සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩලය තුළ තනතුරු 15 ක පුරප්පාඩු 29 ක් වූ අතර ඉන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 10 ක් විය. තවද අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ අතිරික්තය 14 ක් විය. | ජනාධිපතිවරණ මැතිවරණ කාල සීමාවේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීම් සම්බන්ධ අනුමැතිය ලබා දීමට ප්‍රමාද වීම මත අදාළ පුරප්පාඩු පුරවා ගැනීමට නොහැකි විය. | අතිරික්ත හා පුරප්පාඩු තනතුරු සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | පර්යේෂණ කටයුතු වෙනුවෙන් පිහිටුවා ඇති ජාතික මූලික අධ්‍යයන ආයතනය තුළ පර්යේෂණ කාර්යය මණ්ඩලයේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් 1/3 ක ප්‍රමාණයක් (33 %) පුරප්පාඩු වී තිබීම හේතුවෙන් එය ආයතනයේ මූලික අරමුණු ළඟා කර ගැනීමට දැඩි බාධාවක් වී තිබුණි. | මෙම පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණද මේ වන තෙක් අනුමැතිය ලබාදී නොමැති නිසා අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇත. | පුරප්පාඩු වූ තනතුරු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |
| (ඇ) | 2011 අප්‍රේල් 11 දිනැති අංක DMS/E2/62/7/277 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ ලිපියට පටහැනිව 2016 ජනවාරි 02 දින පාලක මණ්ඩලය විසින් 2013 මාර්තු සිට ක්‍රියාත්මක වන පරිදි තාක්ෂණික නිලධාරීන් 13 දෙනෙකු ප්‍රධාන තාක්ෂණික නිලධාරී තනතුරට පත් කර තිබුණි. | තාක්ෂණ නිලධාරීන් 13 දෙනෙකුට ප්‍රධාන තාක්ෂණ නිලධාරී තනතුරට උසස්වීම් ලබාදී තිබෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛන අනුව වේ. | උසස්වීම් ලබාදීමේදී අදාළ චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 මැයි 29 දිනැති අංක DMS/1608 දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) තනතුර වසර 03 ක කොන්ත්‍රාත් කාලයකට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇතත් වසර 05 කට අධික කාලයක් ඉක්මවා ගොස් ඇතත්, එම තනතුර පිරවීමට කටයුතු කර නොතිබුණි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇති වැටුප් ක්‍රමයේ නොගැලපීමක් හේතුවෙන් ඒ පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. | පුරප්පාඩු වූ තනතුරු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### අභ්‍යන්තර විගණනය

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණනය විසින් සමාලෝචිත වර්ෂය තුළ හා ඉකුත් වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ 40 කින් නිරීක්ෂණ 32 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන් නිවැරදි කිරීම සිදු කිරීමේදී ප්‍රමාද වීමක් සිදු වූ බැවින් ඒවා හැකි ඉක්මණින් නිවැරදි කිරීමට කටයුතු කරමින් සිටි. | අදාළ නිරීක්ෂණයන් කඩිනමින් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |